# බළන්ගොඩ නගර සභාව

## 2023.03.07 වන දිනැති විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය-2023.03.07**

**වේලාව- පෙ.ව. 11.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1.ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2.ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3.ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ශාන්තිලේඛා මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රී | මංගලිකා ඉලංගකෝන් මැතිතුමිය |

**නිලධාරී සහභාගීත්වය**

| | |
|---|---|
| 1.ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහිකිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගී වූ ගරු මන්ත්‍රී මණ්ඩලය,ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලය ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

මේ අතර සභාව ඇමතූ සභාපතිතුමා කාලයකට පසුව විශේෂ මහ සභාවක් වෙනුවෙන් මන්ත්‍රී මණ්ඩලයේ උනන්දුවක් පෙනී යන බවද මෙම සභා වාරයට පසුව තවත් එක් මහ සභාවක් පැවැත්විය හැකි බවද පක්ෂ නායකතුමන්ලාගේ තීරණ ක්‍රියාත්මක කළද සභාවේ සියළුම මන්ත්‍රීතුමන්/තුමියන්ලාගේ සහයෝගය සහ සුහදතාවය සභාවේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඉතාම වැදගත් බවද අද දින මෙම විශේෂ සභාව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සහා අනුමැතිය ලබා ගැනීම යන කාරණාව සඳහා පැවැත්වීමට යෙදුන බවද පවසන ලදී.

**01.2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු සභාපතිතුමා අවසන් වශයෙන් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සඳහා සහා අනුමැතිය ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට ස්තූතිය පුද කරමින් අද දින මෙම විශේෂ සභාවේ කටයුතු සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලයට හා කාර්යයමණ්ඩලයටද ස්තූතිය පුද කරමින් පෙ.ව.11.40 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

**ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,**

සභාපති,

බලන්ගොඩ නගර සභාව.